## රත්නපුර ප්‍රාදේශිය සභාව 2022.04.08 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම 2022.04.08 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03. | ටී.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | එන්.විජය ශ්‍රී ශාන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | අයි.වී.අඛිල රෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | කේ.රණවක කළුආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | පී.වී.ඉසුරු ජයලත් විතාරණ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 10 | ජේ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 11. | එම්.ජේ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 12. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 13. | ආර්.බී.නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 14. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 15. | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 16. | පී.වී.ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 17. | ජී.වී.අනුෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 18. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 19. | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 20. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | බී.ඒ.ලලිත් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | පී.රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | කේ.ජී. නිහාල් අමරසිංහ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | ඒ.දොන්.නිශාන් දමිත්අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | පී.උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | ජී.ජී.ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | යූ.කේ.නන්දාවතී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | ආර්.ඒ.පත්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | එම්.වජිරා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 31. | ඩී.නිලන්ති දීපිකා යසරත්න මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 32. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 33. | ඒ.එම්.නිලන්ති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 34. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 35. | රාමසාමි මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 36. | ඕ.කේ.සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන් :-**

01.ජී.යූ.එම්.සී.සිරිවර්ධන මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මහත්මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.03.11 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී ටි.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. **නවනගර විද්‍යාල මාවතේ සමගි මාවත 10 වන පටුමග ලෙස නම් කිරීම වූ ගරු මන්ත්‍රී නිරෝෂන් ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු සභාපති තුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

ii. **මල්වල වැසිකිළි පද්ධතිය හා කඩ කාමරය බදු දිම සඳහා වූ යෝජනාව මසකට රුපියල් 5000.00ක අවම මුදලකට ලබා දීම සුදුසු බවත්, එය විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුව ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්. ඒ.නිලන්ති අමරකෝන් මහත්මිය විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**06.කාරක සභාවල වාර්තා**

2022.02.28 දිනැති මුදල් කාරක සභා වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා හා ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා ඇතුළු විපක්ෂයේ කණ්ඩායම මේ සඳහා බෙදීමක් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර, ගරු මන්ත්‍රී ටී.පේමතිලක මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

i. **ගරු මන්ත්‍රී නිහාල් අමරසිංහ මහතා**

මාගේ මවගේ අභාවය වෙනුවෙන් ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන් හා කාර්යය මණ්ඩලයේ පැමිණි සියළු දෙනාත්, පැමිණි සියළුම දෙනාටත් තද ස්තූතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටින බව එතුමා සඳහන් කළේය.

ii. **ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා**

අද වන විට ආණ්ඩුවටත් ගරු ජනාධිපතිතුමාටත් විශාල ලෙස අපහාස උපහාස කරමින් විරෝධතා පවත්වනවා. ඒ සඳහා කුඩා දරුවන් පවා සහභාගී කරගන්නවා. අන්තර් විශ්ව විද්‍යාල බල මණ්ඩලයේ ශිෂ්‍යාන්ද මෙම විරෝධතා වලට යොමු කරමින් ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරමින් යනවා. 88/89 වැනි කාල වකවානුවක් නැවත ගෙන ඒමට මොවුන් උත්සහ කරනවා මට ඒ කාලය හොඳට මතකයි. අපි ඒ කාලයේ සිටියේ කැලෑවල් වල. රත්නපුර දිස්ත්‍රික්කයේ දරුවන් මේ සඳහා යොමු කරවීම පිළිබඳව මා දැඩි ලෙස විරෝධතාවය එල කරනවා මේ පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා වෙත දැනුම් දී පාසැල් ළමුන් විරෝධතාවන් සඳහා එළියට ගැනීමට උත්සහා දැරීම පිළිබඳව විමර්ෂනයක් සිදු කිරීම සුදුසු බවත්, මෙම කටයුතු සඳහා පිටතින් තරුණ පිරිස් පැමින සිදුකරනු ලබන බවත් මෙවැනි කටයුතු රත්නපුර නගරයේ සිදුකිරීමට ඉඩ ලබා නොදිය යුතු බව එතුමා සඳහන් කළේය.

iii. **ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

විරෝධතා රැලි සඳහා දරුවන් ගෙන ඒමට සමගි ජනබලවේගයේ මන්ත්‍රීවරුන් විදියට තමන් විරුද්ධ වන බව එතුමා පැවසුවේය. සමගි ජන බලවේගයේ නායකයා අපට උපදෙස් දීලා තිබෙනවා දරුවන් මේ

විරෝධතා සඳහා පොළඹවන්න එපා කියලා. කොහොමත් මම 88/89 කාලෙ ඉස්කෝලෙ යන වයසේ කොල්ලෙක් දරුවන්ට වුනු අපහසුතා මං අත්දැකීමෙන් දන්නවා ඒ නිසා මාගේ දරුවාටත් පාසැළ නිමවූ වහාම බස් රථයේ නැගී ගෙදර එන ලෙසට උපදෙස් දී ලා තියෙන්නෙ දරුවන් මෙම කටයුතු සඳහා යොදවා ගැනීමට මා වගේම මෙතන සිටින සියළුම දෙනා විරුද්ධ ඇති බවත් එතුමා සඳහන් කළේය.

දරුවන් විරෝධතා සඳහා එළියට බැසීමට විරුද්ධ වූ වත් රත්නපුර ප්‍රාදේශිය සභාවේ විපක්ෂ නායකවරයා ලෙසට මං සියළුම දෙනාට මේ අවස්ථාවේදී කියන්නේ පාරට බහින්න කියලයි. ඒ තරම් අසීරු අවස්ථාවක තමයි දැන් ජනතාව ඉන්නෙ. අද වන විට අත්‍යවශ්‍ය ආහාර සියල්ලකගේම මිල ඉහළ ගොස් ඇති බවද , ඉදිරියට සිංහල හිංදු අලුත් අවුරුදු උත්සවය පැමිණෙනවා ජනතාව මහත් අමාරු කාලයකට මුහුණ දී ඇති බවද මේ පිළිබඳව කිසිදු කෙනෙක් වගකීමක් නොගෙන කටයුතු කරන බව එතුමා පෙන්වා දුන්නේය. රජයක් හැටියට මිනිසුන්ගේ මේ අපහසුව නැති කිරීමට මැදිහත් වීමක් සිදුනොකරන්නේ මන්ද යන්න එතුමා විමසුවේය. සභාවට අදාල කාරනයක් නොවුනත් රංජිත් මන්ත්‍රීතුමා විමසුවා මේ රජය එපා කියලා විපක්ෂය කියනවා නමුත් බාරගන්නේ නැත්තෙ ඇයි කියලා . මේ වගේ වහුකුණු වෙච්ච ආණ්ඩුවක් බාර ගැනීමට විපක්ෂයටඅවශ්‍යතාවයක් නොමැති බව එතුමා පැවසුවේය. පසුගිය ආණ්ඩුවේ ණය ගනු දෙනු නිසා මේ තත්වයට පත් වූ බව නමුත් පෙර වර්ෂවල හරියට ගණන් විමසීමක් කළහොත් කුමන වකවානුවල දී ලබාගත් ණය ද යන්න සිතාගතහැකි බව එතුමා පැවසුවේය.

මිනිස්සු මහා පාරට බැහැලා තියෙන්නේ අද කන්න නෑ, ගැස් නෑ,තෙල් නෑ තමුන්නාන්සේගේ වාහනේටනම් තෙල් ගහන්නෙ සභාවෙ මුදලින් අද වන විට ඩීසල් ලීටර් දහයක් පහලොවක් හොයාගන්න එක අද වන විට මහත් අසීරුතාවයක් වෙලා තිබෙන බව එතුමා සඳහන් කළේය. එසේ නොවන්නේද යන්න එතුමා ගරු සභාපතිතුමාගෙන් විමසුවේය. ඉන්දියාවෙන් ගත් ණය තව මාසයකින් ඉවර වෙනවා ඊට පස්සෙ රටේ මුදල් නැතිව රටේ ආර්ථිකය තවත් කඩා වැටෙනවා එහෙම රටක්ද අපේ නායකයාට බාරගන්න කියන්නෙ , අපේ නායකතුමා මේවා මීට කලින් පෙන්වා දුන්නා , කලින් හිටපු නායකතුමා දින වකවානුත් සමග කිව්වා මේ අයුරින් සිදුවන බව එතුමා සඳහන් කළේය. ජනතාව දුක් විදිනවා ඒ ගැන ඔබ තුමාලා හිතන්නැත්තේ ඇයි කියලයි මම අහන්නේ. අපිත් එක්ක ඔබලා තර්ක කරනවා මෙතනට ඇවිත් ඔබලත් එක්ක අපි තර්ක කරනවා නමුත් රටේ ප්‍රශ්ණ එතනමයි. ඔබලා කියනවා පාර්ලිමේන්තුවේදී හරීන් ප්‍රනාන්දු කියපු කතාව හරි කියලා එතුමාගේ කතාවේ හරි කොටස් ඇති නමුත් එතුමාගේ වැරදි ඕනතරම් තිබෙන බවත්, එම වැරදි ඔබලා හරි ලෙස පිළිගන්නා බවද එතුමා සඳහන් කළේය. මේ රටේ මිනිස්සු වෙනුවෙන් ඉදිරිපත් වෙන්න කියලයි අපි කියන්නෙ. අද මේ සභාවේ මිනිස්සු වෙනුවෙන් ඉදිරිපත් වෙන්නෙ කවුද කියලා බලන්න තමයි රොහාන් මන්ත්‍රීතුමා මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සඳහා බෙදීමක් ඉල්ලා සිටියේ.නමුත් ඔබතුමා හා කණ්ඩායම එකතුවෙලා ඒක ඇහුරුවායි කියන එක පැහැදිලිව කියන්න ඕනි. වාහනය රෙපෙයාර් කරපු එකට අපේ විරුද්ධතාවයක් නැහැ.ඒකට නොවෙයි අපි විරුද්ධ වෙලා තියෙන්නේ හයලක්ෂ තිස් දෙදාහසක් පමණ අතිවිශාල මුදල ගත්තටයි.ඒකටත් සාධාරණ මුදලක් දැම්මනම් අපි විරුද්ධ වෙන් නැහැ. ඒකයි මන්ත්‍රිවරුන්ට කියන්නේ හදවතට එකඟව කතා කරන්න කියලා. මෙතන දෙපැත්තට වෙලා වාද කරලා අපි ගෙදර යනවා ජනතාවට සෙතක් නැහැ ඒ නිසයි මේ පිළිබඳව බෙදීමක් ඉල්ලුවෙ ජනතාවට සාධාරණයක් කරන්න ඕන නිසා නමුත් ඒකට ඉඩක් නොමැත්තේනම් අපේ කණ්ඩායම තව දුරටත් මෙහි රැඳී නොසිට පිටවී යන බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. අනතුරුව සමගි ජන බලවේගයේ කණ්ඩායම සභාවෙන් පිටව යන ලදී.

### iv. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා

ඊයෙ අප ප්‍රදේශයේ විරෝධතාවයක් ක්‍රියාත්මක වෙනවා .එක් සක්කිලියෙක් සක්කිලි වැඩක් කළා ඔහු සක්කිලි වැඩ කළාට ඔහුට උත්තර දෙන්න අපිට පුළුවන්. මේ අවස්ථාවේදී කියනවා ඒ සක්කිලියට සක්කිලි වැඩ කරන්න එපා කියලා .නරක වචන භාවිතා කරන්න හොඳ නැති වුවත් සක්කිලියන්ට ඒ විදියට කතා නොකර බැරි බව එතුමා පැවසුවේය.

### v. ගරු මන්ත්‍රී නිලන්ති අමරකෝන් මහත්මිය

අද උදේ දෙරණ අරුණ බලද්දි මට ඇහුනා ඉන්දියාවේ හිඟාකන පුද්ගලයෙක් එරට මුදලින් රුපියල් අසූදහසක් ලංකාවේ මිනිසුන් දුක්විදින නිසාවෙන් පරිත්‍යාග කිරීමට කටයුතු කර ඇති බවට එය ඉතාමත් සංවේදී කතාවක් අපි වෙනුවෙන් හිඟාකන මිනිහත් සල්ලි දෙන්න ලෑස්තිවෙලා ඒ තරමට රට වැටී ඇති බව එතුමිය පැවසුවාය. ඔය පපුවෙ ඇතුලෙ ඉන්න මිනිහයි ඔය වචන වලින් එලියට එන මිනිහයි දෙන්නම එක්කෙනෙක් වෙනවා නම් මේ තරම් විනාශයක් රටට සිදු නොවන බව එතුමිය පැවසුවාය. ඉන්දියාවේ විතරක් නෙවෙයි තායිලන්තය, බංග්ලාදේශයේ මිනිසුන් පවා හිඟා කනවා අපිට ජීවත් වෙන්නට මුදල් එවීමට. අද මුදල් කාරක සභාවේදී සභාපතිතුමාගේ වාහනය සඳහා රුපියල් ලක්ෂ හයයි ගානක් වැය කලා කියලා දැක්කම මගේ පපුවට පිහියෙන් ඇන්නා වගේ දැනුනා ඇයි අපිට කැප කිරීම් කරන්න බැරි අපි කවුරු වෙනුවෙන්ද මේ ඇවිත් තියෙන්නේ.කවදාවත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කරපු වැඩ ටික කරන්න කාටවත් බෑ මහින්ද රාජපක්ෂ කියන්නේ සන්නාමයක් , පිළිම හඳලා මිනිස්සු වඳින්න හිටපු කෙනෙක් නමුත් මේ අවස්ථාවේදී ගත්තෙ වැරදි තීරණයක්, නාලන්ද එල්ලාවල මරපු අයව ගෝල්ෆේස් පිට්ටනියට ගෙනැත් එල්ලනවා කියලා චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමිය කිව්වා නමුත් එතුමියට එය කරගන්න බැරි වුනා .සුසන්ත පුංචි නිලමේ ඇමතිතුමා අපේ රජයේ ජාතිය ගොඩනැගීමේ ඇමති ධුරයේ දිවුරුම් දුන්නා. ඒ වගේ ප්‍රතිපත්ති එහාට මෙහාට යන්නෙ .මේ වෙලාවේ හදවතේ ඉන්න මිනිහා අවදිවෙන්න ඕනි. මේ අවස්ථාව බොහොම අසීරු අවස්ථාවක් මෙ වෙලාවේ අපි අපේ අඩුපාඩු හදාගත්තෙ නැත්නම් ප්‍රාදේශිය සභාව හදා ගත්තෙ නැත්නම් ඉහල හඳන්න බැහැ යනුවෙන් එතුමිය සඳහන් කළාය.

නගර අලංකරණයට විශාල මුදලක් වැය කරලා තිබෙනවා නමුත් මේ අවස්ථාවේදී භාණ්ඩාගරය තුළ මුදල් නොමැතිව ඇයි මේව කළේ. අපේ මන්ත්‍රීවරුන්ට කියන්නේ ඇත්ත තත්වය තෙරුම් අරගෙන කතා කරන්න නිකම් බුම්මැට්ටයො වගේ මෙතන ඉඳගෙන වාද කරලා වැඩක් නැහැ . රට විනාශය කරා යනවානම් ඒ සඳහා කණ්ඩායමක් ලෙස අපි වගකියන්න ඕනි.මටත් දරුවන් තුන්දෙනෙක් මට ඉන්නවා අම්මා කෙනෙක් හැටියට දරුවන්ගේ අනාගතය වෙනුවෙන් රටක් නැතිවෙනවාට මං කැමති නැහැ අසාධාරණයක් වෙනවා නම් ඊට එරෙහි වෙන්න ඕනි තාත්තලා හැටියට ඇයි එසේ කරන්නට බැරි මන්ත්‍රීවරුන් විදියට අපි ජනතාවට සාධාරණයක් කළ යුතුයි මෙතන කණ්ඩායමක් හැටියට වැඩ කටයුතු කරනවා හැරෙන්නට වෙන කිසිදු නෑ කමක් මට නෑ ඒ නිසා අසාධාරණ වන අවස්ථාවකදී මං කතා කරනවා යැයි එතුමිය පැවසුවාය.

### vi. ගරු මන්ත්‍රී කේ.ඒ.ජයරත්න මහතා

රටේ යම්කිසි ව්‍යසනයක් තිබෙන බව පිළිගත යුතු වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතා ගෙන ඒම සඳහා එක්සත් ජාතික පක්ෂයේ පිරිස පවා ඡන්දය ලබා දුන්නා හැට නව ලක්ෂයක් ඡන්දය දුන්නේ ඒ නිසා. එතුමා නව මඟකට රට ගෙන යාමට උත්සහා ගත් නමුත් කොරෝනා උවදුර නිසා ඒ ගමන හිතපු ආකාරයට යා ගන්නට නොහැකි වුනා.එන්නත් කරණය සඳහා විශාල මුදලක් වැය කරන්නට වුනා මෙම එන්නත් ලබා දී ජනතාව කොරොනා උවදුරින් බේරාගත්තේ එතුමායි. අද උද්ඝෝෂන සඳහා යාම සඳහා ද ජීවත් වීමට හැකියාවක් ලැබුනේ ගෝඨාභය රාජපක්ෂ මහතා නිසා බව එතුමා පැවසුවේය.

රටේ මේ සිදුවන සෑම කාරණාවක් සඳහාම ගෝඨාභය රාජපක්ෂ මහතා ආපස්සට හරවා යැවීම සඳහා ඇතුලතින් ආණ්ඩු පක්ෂයේම අය, විපක්ෂයේ අය විරුද්ධව කටයුතු කළ කණ්ඩායම් සිටි බවත් මේ හේතු රටේ ආර්ථික තත්වය කඩා වැටීමට හේතු වූ බවත්, ප්‍රධානම කාරණාව ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය රසායනික පොහොර ලබා නොදීම බවත් එතුමා සඳහන් කළේය. ඒ තුළින් කුඹුරු පමණක් නොව , තේ කර්මාන්තය, කුරුදු , රබර්එළවලු ආදී සියළුම කෘෂි කර්මාන්ත කටයුතු ඇනහිටි බව එතුමා සඳහන් කළේය. එතුමා හොඳ දැක්මක් ඉස්සරහට ගේන්නට උත්සහා කළද අපිට එහි විපාකය ඉක්මනට ලැබුණු බව එතුමා පැවසුවේය. පොහොර නොමැති නිසා වී අස්වැන්න අඩු වීම හේතුවෙන් හාල් මිල ඉහළ ගියා මේ අයුරින් දුර දක්නා නුවණින් කටයුතු නොකිරීම නිසා රට මේ තත්වයට පත්වූ බවත්, එය පිළිගතයුතු බවත් එතුමා පැවසුවේය . ඒ වන විට රටේ ආර්ථිකය බිඳවැටිලා වෙළෙඳපොළට යම් යම් නීති දාල රැකගැනීමට කටයුතු කළත් රජයක් හැටියට ඇමතිවරයෙක් හැටියට මෙය අතහැරලා දැම්මා ඒ තුළින් වෙළෙන්දා තමන්ට හිතු හිතු ආකාරයට වෙළදාම් කරන්නට පටන් ගත්තා. මහින්ද රාජපක්ෂ මහත්තායාගේ කාලෙ ඇණවුම් කළ පොහොර නැව් මෙරටට ඇවිත් තිබුණා රුපියල් එක්දහස් පන්සියයට විකුණන ලද පොහොර මෙම පොහොර නතර කිරීමත් සමඟ ගොඩ බැවෙ රුපියල් හත්දහස් පන්සියයට, මේ වන විට රුපියල් දොළොස් දහස පමන දක්වා මිළ ඉහළ ගොස් තිබෙනවා තව ටික දවසක් යන විට රපියල් විසි දෙදහස දක්වා ඉහළ යන බව දැන ගන්නට ලැබෙන බව එතුමා පැවසුවේය. මැති ඇමතිවරු මෙම ගැටළු විසඳීම සඳහා කතා කළ යුතු බවත්, මේ වසරකට එහාදි ගෙනාපු පොහොර කවරය අළුත් කරලා නව මිළ ගහලා විකුණන්නෙ. ගෝඨාභය ජනාධිපතිතුමා පත්වුනාට පසුව රටට පොහොර ගෙනාවෙ නැති බවත් එතුමා සඳහන් කළේය. මේ වැඩි මිළට දෙන්නෙ ඒවා තමයි මේ පාළන මිළ නොමැති නිසා තමයි අද මිනිසුන් පාරට බැහැලා තියෙන්නෙ.

ඒ වගේම හාල් මාෆියාව අද වන විට ඉහළ ගොස් තිබෙනවා. මේ යලේ අස්වැන්න ගොවීන් වෙළෙඳපළට නිකුත් කළේ නෑ. හාල් මෝල් අයිතිකරුවන් පෙර තිබූ හාල් වැඩි මිළට විකුණනවා, ඊට අමතරව පිටරටින් හාල් ආනනය කරනවා මෙම හාල් වෙළෙඳපළේ වැඩි මිළට විකුණන බව එතුමා පැවසුවේය. සිමෙන්ති කොට්ටය අටසිය පනහට, නවසිය පනහට තිබුණ ඒවා දැන් වෙළෙඳපළේ දෙදාහස් පන්සියයට ගොස් තිබෙනවා.මිළ පාලයෙන් තොරයි. මේ හේතු නිසා තමයි මිනිසුන් පාරට බැහැලා තියෙන්නෙ. මේවා වලක්වන්න හදවතින් හැදුවත් අද වන විට මේවාට එරෙහි වෙන්න අපිට බැරි වී තිබෙනවා මේ තත්වයන්ට පත්කළේ ඇමතිවරු හා ඉහළ නායකයින් බව අපි පිළිගතයුතු වෙනවා. පක්ෂ ආරක්ෂා කර ගන්න බැරි තත්වයට පත්වී හමාරයි මිනිසුන් ඉන්නෙ වෙනත් මාර්ගයක .

අපි කවුරුත් උසිගන්නලා නෙවෙයි මින්සුන් පාරට බහින්නේ දරුවන් පවා අද පාරට බැහැලා ඉන්නෙ. අද රට කොයිබටද යන්නෙ රටේ නායකයා පැන්නුවා කියලා රටට සෙතක් වෙයිද මේ පිළිබඳව සැළකිලිමත්ව කටයුතු කළයුතු බවත් එතුමා පැවසුවේය. ඇඳිරිනිතිය නීතිය පැනවූ අවස්ථාවේදී පෙළපාලි යනවා රටේ නීතියට පිටුපාල මෙවැනි කටයුතු කිරීම තුළ සිදුවන ආදර්ශය කුමක්ද යන්න එතුමා විමසුවේය.අනාගතයේ ඉන්න තරුණයින්ට දෙන පණිවඩය කුමක්ද යන්න විමසා සිටියේය.පොදු ජන පෙරමුණෙන් පත්වුණ මන්ත්‍රීවරු හැටියට රටේ ප්‍රශ්ණ පිළිබඳව කතා කළයුතු බවත් බල ප්‍රදේශයට පමණක් නො වේ රටට ව්‍යසනයක් වෙනවානම් අපි කතා කළ යුතුයි යන්න එතුමා පැවසුවේය. විපක්ෂය ජනතා විමුක්ති පෙරමුණ කෑගහනවා ගෝඨාභය රාජපක්ෂ ගෙදර යන්න කියලා ඒ අයට බලය ගන්න ඡන්දතියන්න ගියොත් රටේ ජනතාවට හිඟාකන්නවත් බැරි තත්වයට පත්වන බව එතුමා පැවසුවේය. රටේ සල්ලි නැතිවෙනවා , ආහාර නැති වෙනවා, මගේ මතය නම් කළ හැකි පුද්ගලයෙකුට දීලා මෙය පවත්වාගෙන යා යුතු බව එතුමා පැවසුවේය. ගෝඨාභය ඉවත් කර එන පුද්ගලයා කවුරුන් හෝ වේවා මේ රට තුළට ඩොලර් එන්නෙ කොහෙන්ද, ආහාර ටික එන්නෙ කොහෙන්ද රට ගොඩගන්නේ කෙසේද යන්නපැහැදිළි දැක්මක් ඉදිරිපත් කර බාර ගැනීම තුළින් මේ ගැටළු විසඳා ගතහැකි බව එතුමා පැවසුවේය. එසේ නැතිව ජනතාව උසිගන්නලා , ජනතාව පාරට බැහැලා මේ ගැටළු විසඳිය නොහැකි බව එතුමා පැවසුවේය.

රෝහණ විජේවීර මහතාත් සමඟ මම කතා කරලා තිබෙන බවත්, 88/89 කාලෙ තිබුණු භීෂණය පිළිබඳව මම දන්නවා . මෙම කාල වකවානුවේ වුණු සිද්ධි පිළිබඳව එතුමා මන්ත්‍රීතුමන්ලා වෙත පැහැදිලි කිරීමක් කරන ලදී. මේ රටේ නැවත එවැනි යුගයක් ඇති කළ යුතු නැහැ. ජනතා විමුක්ති පෙරමුණ විසින් ඒවා නැවත කරයි කියලා කියන්නෑ ඒ යුගය ඉවරයි. එදා සිද්ධි නැවත කිය කියා ගලේ ගැසිය යුතු නැති බව එතුමා පැහැදිලි කළේය. එදා වගේ නෙවෙයි අද වන විට සමාජය දියුණුයි. එදා මේ රට මේ තරම් දියුණු නැහැ. අද එදාට වඩා දියුණු වී ඇති රට නැවත එම තත්වයට පත්විය යුතු නැති බවත් ඒ අයුරින් පවත්වාගෙන යාම සඳහා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සිටිය යුතු බවත් එතුමා සඳහන් කළේය.

බුදුන් වහන්සේගේ ධර්මයට අනුව මේ එල විපාකයක් ඇති වී තිබෙන්නේ . අවුරුද සියයකට සැරයක් විපර්යාසයකට පත්වෙනවා. නැත්නම් අවුරුදු විස්සකට සැරයක් සිදුවෙනවා . මේ රටේ නව නිෂ්පාදන ඇති නොකිරීම තුළ හා කෘෂි කර්මාන්ත දියුණු නොකිරීම තුළින් විදේශ රටවලින් විශාල වශයෙන් ණය ලබා ගැනීම තුළ ණය මත් දුවපු රටක් හැටියට රටේ ආර්ථිකය විනාශ වී ඇති බව එතුමා පැවසුවේය. රට ගොඩගන්න ඕන රටේ ජනතාව ගොඩගන්න ඕනි බව එතුමා පැවසුවේය. ජනතාවගේ ආහාර ඇතුළු මූලික අවශ්‍යතා සපුරා දීමට කටයුතු කළයුතු බවත්, රටේ ජනතාව මැති ඇමතිවරුන් ඡන්දය දී පත්කර ඇති බැවින් ඔවුන් මේ අවස්ථාවේ දී සැඟවී නොසිට ජනතාවගේ ගැටළු විසඳීම සඳහා ඉදිරිපත් විය යුතු බව එතුමා සඳහන් කළේය. මේ රට දරුවන්ට සෑදිය යුතු බව එතුමා සඳහන් කළේය. කටින් ගහලා ප්‍රශ්ණ විසදිය නොහැකි බවත් හෘද සාක්ෂියට එකඟව කටයුතු කළයුතු බවත් එතුමා සඳහන් කළේය.

### vii. ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා

ගරු මන්ත්‍රීතුමන්ලා සඳහා සිංහල අළුත් අවුරුද්ද සඳහා මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙන උත්සව දීමනාව ලබාදෙන ලෙස ගරු උප සභාපතිතුමා යෝජනා කළේය. එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් එම අවස්ථාවේදීම හදිසි යෝජනා යටතේ ස්ථිර කරන ලදී.

ලබන්නාවූ සිංහල හා හිංදු අළුත් අවුරුද්දට පෙර මේ රට පත්ව ඇති තත්වයෙන් මීදී සෞභාග්‍යයන් පිරි සාමකාමී රටක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

### viii. ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා

கௌரவ பிரதேச சபை உறுப்பினர்களே. கௌரவ செயலாளர் அவர்களே, வணக்கம். எமக்கு எந்த சூழ்நிலை எப்படி வந்தாலும் நாம் கண்டிப்பாக வாழ்ந்தே ஆக வேண்டும். என்னவானாலும் எப்படியும் வாழவே போகின்றோம். எதற்கும் முகம் கொடுக்ககூடிய தைரியம் அனைத்து மக்களுக்கும் கிடைக்க வேண்டுமென இறைவனை பிரார்த்தித்துக்கொள்வதோடு உங்கள் அனைவருக்கும் இனிய சித்திரை புத்தாண்டு நல்வாழ்த்துக்களை தெரிவித்துக்கொண்டு எனது நல்லாசிகளை கூறி விடைபெறுகின்றேன். நன்றி வணக்கம்.(ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමනි. හිතවත් ගරු ලේකම්තුමනි, ආයුබෝවන්. කුමන තත්වයන් යටතේ වුවද අප අපගේ ජීවිතය ගත කළ යුතුය. අපි කොහොම හරි ජීවත් වෙන්නයි ඕනි.. සියලුම මිනිසුන්ට ඕනෑම දෙයකට මුහුණ දීමට ධෛර්යය ලැබේවායි මම දෙවියන් වහන්සේට ප්‍රාර්ථනා කරන අතර ඔබ සැමට සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කර සමුගනිමි.)

### ix. ගරු මන්ත්‍රී අචිල රෝෂන් ලක්මාල් මහතා

ආණ්ඩුව නියෝජනය කරන පිරිස ලෙස මේ වෙලාවෙ අපේ රජයට අපි හැරන්නට දොස් කියන්නැති කවුරුත් නොමැති බව එතුමා පැවසුවේය. රත්න කනේගල්ල මන්ත්‍රීතුමා පැවසූ පරිදි තේ, ගම්මිරිස් , පුවක් , කුරුදු වැනි සියළුම දේට හොඳ මිළක් ගෙවනවා නමුත් ,මේ වා සමාජ ගත වෙන්නේ නැහැ. අද වන විට අපේම තියන ආර්ථික ප්‍රතිපත්තිවල තිබෙන වැරදි නිසා කළු කඩය තමන්ට ඕන ආකාරයට තමයි ගණුදෙනු කරන්නේ. තේ කර්මාන්ත ශාලා හිමියන් රුපියල් එක්දහස් පන්සියයට පොහොර මීටිය ගෙනාව නමුත් එය විකුණවේ රුපියල් හයදහසට බව එතුමා සඳහන් කලේය.අදවන විට යූ කාණ්ඩේ තියන පොහොර මීටියක් රුපියල් විසි එතර දහසක් බව එතුමා පැවසුවේය. දළු කිලෝ එකක් රුපියල් 200.00ට ගියත් ලාබයක් නෑ. අදවන විට මෙතන සමගි ජනබලවේගය හිටියත්, ජනතා විමුක්ති පෙරමුණ හිටියත් ,ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හිටියත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හිටියත් ඒගොල්ලො මොනවද මේ කරනනේ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි පුළුවන් තරම් ඉක්මනට කණ්ඩායමක් ලෙස එකතු වී අවුරුද්දට පෙර යෝජනාවක් හදලා යවමු. පාර්ලිමේන්තු මන්ත්‍රිවරු මේ ප්‍රශ්ණයට මුහුණ දෙන් නෑ. ගම්වල සිටින අපි තමයි මුහුණ දෙන්නේ , මළ ගෙදරකට යන්න බැරිනම් , පාරේ යන්න බැරිනම්, හවසට කඩ මණ්ඩියට යන්න බැරිනම් , ජනතාව කියන කතා වලට අපේ හිත බිදෙනවානම් එතන ප්‍රශ්නයක් තියෙනවා සභාපතිතුමනි.

අපි එකතුවෙලා පත්කළ රජය මේක ඔවුන් නොවෙයි ජනතාව සමඟ ගැටෙන්නේ අපියි. බලය ගත්තට පස්සේ මොලය නෑ වගේ ඔවුන් ඡන්දය ලබාගත් පසු ප්‍රාදේශිය මන්ත්‍රීවරුන් ගණන් ගන් නෑ ඔවුන් අපි කියන දෙයක් අහන් නෑ. කෙළවුනාට පසුව තමයි අපි ළඟට එන්නේ .ඒ නිසා ගරු සභාපතිතුමනි එයාලා එයාලගේ වැඩ කර ගන්නවා. ෂෙඩ් එකක් ළඟට ගිහින් තෙල් ගහගන්න ගියොත් මිනිස්සු බනිනවා ඒ නිසා මේ සම්බන්ධව වැඩපිළිවෙළක් සකස් කර යෝජනා මාළාවක් අපි සභාවෙක් හැටියට ඉදිරිපත් කර යවමුයැයි එතුමා යෝජනා කළේය.

ෆේස්බුක් රැල්ල නිසා අද වන විට තරුණ රැල්ලක් ඇති වෙලා තිබෙනවා. අද වන විට නොදන්නා මිනිසෙක් දාපු ෆෝස්ට් එකකට ජනතාව එකතුවෙලා තිබෙනවා.මේවට අපේ රජයත් වගකියන්න ඕනි, මන්ත්‍රීවරුන් ඇමතිවරුන් ජනතාවට සවන් දෙන්නේ නැහැ ජනතා ගැටළු විසඳන්න වුවමනාවක් නැහැ. උද්දච්ච කම වැඩි වුණා , මාධ්‍යට කතා කරලා විසඳුමක් කියන් නෑ ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ආ..ඒක කමක් නැහැ කිනවා. ඒ තුළින් ජනතාවගේ පීඩනය වැඩිවෙලා තිබෙනවා. අවුරුද්දට ප්‍රථම මේ සඳහා විසඳුමක් නොලැබුණහොත් මීට වඩා මේ පීඩනය පුපුරනවා. අපිට පාරේ බැහැල යන්න බැරි වෙනවා. ඒ නිසා හැකි ඉක්මනින් රැස්වෙලා යෝජනාවක් හදලා යවමු පාර්ලිමේන්තුවේ සිටින 225 දෙනාටම මේ අවස්ථාවේදී පක්ෂභේද අමතක කර රට ගොඩනැගීම සඳහා උනන්දුවන ලෙසට. මෙම යෝජනාව විපක්ෂයටත් මං ඉදිරිපත් කරන්න හිටියේ ඔවුන් වේලාසන නැගිටලා ගියා. සිම්බාබ්වේ වගේ ඡනද තිය තියා ඇවිත් රට ආරාජිකත්වය කරා යනු ඇතැයි එතුමා පැවසුවේය.  අපේ දරුවෝ තව අවුරුදු දහයකින් අපිත් මේ සභාවේ ඉදලා මේ තත්වය රටට අත්කරදීමට සම්බන්ධ වී ඇතයි විමසීම් කරනු ඇති බව එතුමා සඳහන් කළේය.

### x. ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා

පක්ෂයක් විදියට පැහැදිලි කිරීම කිහිපයක් කරන්න අවශ්‍යයි. පක්ෂයක් හැටියට මේ රටතුළ ඇති වී තිබෙන අර්බුදය මහපොළවේ යථාර්ථයක් ලෙස දැකිය යුතු බව එතුමා සඳහන් කළේය. මේ ජනතාවට දැරිය නොහැකි ආර්ථික අර්බුදයක් ඇති වී තිබෙන බවත්, කිරි දරුවන් වඩාගෙන පවා පාරට එන තත්වයක් නිර්මාණය වී තිබෙන බව එතුමා සඳහන් කළේය. හෙට දවසේ අපි කාටවත් කියන්න බැහැ ඩීසල් , ගෑස් එනවද කියන්න බැහැ.

රංජි මන්ත්‍රීතුමා සඳහන් කළා විරෝධතා සඳහා අපි පොඩි ළමයි ගෙන්වනවා කියලා .මේ විරෝධතා අපි විතරක් සංවිධානය කරන ඒවා නොවෙයි විවිධ පාර්ශයවයන් සංවිධානය කරන ඒවා ගුරුවරුන්, නීතිඥයින්, විවිධ සංවිධාන මගින් මේ සියල්ලටම අපි වගකිම දරන්නට නොහැකි බවත්, තම පක්ෂය සංවිධානය කරන විරෝධතා සඳහා විධිමත් අයුරින් විනයක් ඇතිව අපි වගකීමෙන් සිදුකරන බවත්, අපි අපේ විරෝධතා සඳහා වගකියන බව එතුමා සඳහන් කළේය.

අපේ විරෝධතා වලට කඩාකප්පල් පිරිස් කඩා වැදී සිදු කරන ක්‍රියා පිළිබඳව අපි රටට හෙළි කරනවා. එවැනි කටයුතු පසු ගිය කාලයේදී සිදුවුනා රජයක් හැටියට ඔවුන් අල්ලා ගැනීමට හැකියාව තිබෙනවා තුනෙන දෙකක බලයක් තිබෙනවා. අපි කියන්නේ රජයට එම කඩාකප්පල් කාරී වැඩ කරන්නට ඉඩ දෙන්න එපා කියලයි.

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරයා ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩ සටහන් සඳහා සහභාගී වනවා. හෘද සාක්ෂියට එකඟව අපි වැඩ කරන්නේ. අපිට අවශ්‍ය නැහැ බස් ගිනි තියන්න කඩා කප්පල්කාරී වැඩ කරන්න. අපිට අවශ්‍ය මේ රට හොඳ පැත්තට ගිනිහින් යහපත් දෙයක් සිදුකරන්නට ඇති වුවමනාව පමණයි අපිට තිබෙන්නෙ. අපි ඒ කැප කිරීම එදා ඉදන්ම කරනවා.

මුදල් කාරක සභාවේ අනුමත කර ඇතිකුලී පදනමට ගත් වාහන පිලිබඳව අනුමත කරන්න බැහැ.රටේ පවතින මේ තත්වයත් සමඟ ජනතාව අපෙන් මේ පිළිබඳව විමසීම් කරනවා මුදල් කාරක සභාවේ සිටින මන්ත්‍රීවරුන්ටත් මෙය හොද නැති බවත්, අපි මන්ත්‍රී දීමනාව පවා කැප කරමින් කටයුතු කරන බව එතුමා සඳහන් කළේය.

හෙට දවසේ දිනෙන් දින වැඩි වන භාන්ඩ මිලත් සමඟ ජනතාව අපහසුතාවට පත්වන බවත්, අපි ජනතාව වෙනුවෙන් කැපවී පක්ෂයක් විදියට අරගලයක යෙදෙන බව එතුමා සඳහන් කළේය. රට පුරාම ජනතාවට ජයග්‍රහණය ලඟා කරදීම සඳහා තමන් පක්ෂය අරගල සඳහා යොමු වන බව එතුමා සඳහන් කළේය.

### xi. ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා

මුදල් කාරක සභාව පිළිබඳව ගැටළුකාරී තත්වයන් කතා කළ නිසා ඒ පිළිබඳව අදහස් දැක්වීම සුදුසු බව තීරණය කළා. මුදල් කාරක සභාවට එන කිසිම වවුචර් පතක් නීත්‍යානුකූල නැත්නම් අපි එය අනුමත කරන්නේ නෑ වාහන සම්බන්ධව ගෙවීම් කිරීමේ දී වුවද විෂය භාර නිලධාරියාගේ වගකීම තමයි ඊට අදාල වච්චර්පත් ,කාර්මික නිලධාරී වාර්තා ,ඊට අදාල වන වෙනත් ලියකියවිලි සමඟ සම්පූර්ණ කරන ලද බිල්පතක් ඉදිරිපත් කිරීම. විෂය නිලධාරීන්ගේ හා ලේකම් තුමියගේ වගකීමක් වෙනවා එසේ නිවැදි වච්චර් පත් ඉදිරිපත් කිරීම. මුදල් කාරක සභාව සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් නිවැරදි නැත්නම් ඉදිරිපත් නොකර සිටීමට ඔවුන් කටයුතු කළ යුතුයි. මෙවර මුදල් කාරක සභාවේ අනුමැතිය ලැබි ඇති ගරු සභාපතිතුමා වෙනුවෙන් ලබාගත් කුලි පදනම්ව ලබාගත් වාහනය වෙනුවෙන් බැලූ බැල්මට විශාල මුදලක් ලෙස පෙනුනත් සභාපතිතුමාගේ නිල රථය අළුත්වැඩියාව සඳහා යොමුකළ කාල වකවානුවට අදාලව මෙය එතරම් මුදලක් නොවන බව එතුමා පැවසුවේය.

රටේ පවතින තත්වය පිළබඳව කණගාටුයි. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිළ ඉහළයි. ඒවායේ මිළ අඩු වෙනවනම් තමයි හොඳ. කොම්පෝස්ට් පොහොර සමඟ 50%ක්වත් රසායනිත පොහොර ලැබෙනවානම් වඩාත් සුදුසු බවත්, අපි ඉන්නේත් ජනතාවගේ පැත්තේ බව එතුමා පැවසුවේය.

අනුර කුමාර දිසානායක මහතා මේ අවස්ථාවේදී මෙම අසීරු තාවය දඩමීමා කරගෙන තරුණයින් පාරට ගෙනගොස් කරන සිදුවීම් නොකරන ලෙස දැන්විය යුතු බව එතුමා සඳහන් කළේය. දේශපාලන පක්ෂ

හේදයකින් තොරව මෙම ප්‍රශ්නයට විසඳුම් සෙවීම සඳහා කටයුතු කළ යුතු බවද, මැතිවරණයකට ගොස් මෙම ප්‍රශ්නයට විසඳුම් සෙවීමට මෙම කාලය නොවන බවද එතුමා වැඩි දුරටත් සඳහන් කළේය.

**xii. ගරු සභාපතිතුමා**

රටේ තත්වයට විසඳුම් ලැබිලා යහපත් දිනයක් උදාවේවායි කියලා ප්‍රාර්ථනා කරන බවත්, ජනාධිපතිතුමා උපරිමයෙන් කැපවීම් කරන බවද, ආර්ථික විශේෂඥයින් කණ්ඩායමක් පත්කර ඇති බවත්,එයින් යම්කිසි විසඳුමක් ලැබෙනු ඇතැයි එතුමා පැවසුවේය. පළාත් පාලන ආයතන වල නියෝජිතයින් සමඟ සාකච්ඡාකර යෝජනාවලියක් ගරු ජනාධිපතිතුමා වෙත යොමු කිරීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමා පැවසුවේය.

අද දින මහා සභාවට පැමිණ තම අදහස් හා යෝජනා ඉදිරිපත් කරමින් මේ දක්වා රැඳී සිටි සියළුම ගරු මන්ත්‍රීතුමාලා තුමියන්ලා වෙත හා සහභාගී වූ නිලධාරීන්ටද ස්තූතිය එල කරමින් අද දින මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**